Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
www.sannasa.com

email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241 after 4pm

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




# නීතිය හා සදාචාරය

ජනකාන්ත ගායක එච් ආර් ජෝතිපාල ශූරීන්ගේ ගී කීපයක් තරුණ ගායක ශෙහාන් මිහිරංග විසින් ඔහුගේ හඬින් තැටිගත කරනු ලැබ විකිණීම සම්බන්ධයෙන් විවිධ මත පළවී ඇත.

ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පනතට අනුව ගීයක අයිතිය ඇත්තේ පද රචකයාට හා සංගීත නිර්මාපකයාටයි. ගායකයා යනු හුදෙක් ගීතය ශ්‍රාවකයා වෙත ගෙන යන අතරමැදියකු පමණකි. ඒ අනුව සංගීතඥයාට හා පද රචකයාට තමන්ගේ ගීත ඕනෑම ගායකයකු ලවා ගායනා කරවීමේ නීතිමය අයිතිවාසිකම ඇත . ශෙහාන් ගේ මේ සංගත තැටිය නිකුත් වන්නේ ද ඒ නීතිමය සීමාව යටතේ ය. මේ සංගත තැටියේ එන ගීත සියල්ලේම සංගීත නිර්මාපකයා සරත්ද අල්විස් ය. සරත් ද අල්විස් සංගීතඥයාට තමන් නිර්මාණය කර ජෝතිපාලයන් ගායනා කළ ගී වෙනත් ඕනෑම ගායකයකු ලවා ගායනා කරවීමේ නීතිමය අයිතිවාසිකම ඇත.

ගැටලුව වන්නේ නීතියෙන් ආවරණය වන සියලුම දේ සදාචාරාත්මක ද යන්නය.

**සංස්කාරක**




